# ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ ක්ෂේත්‍රය

## අධ්‍යාපන හා වෘත්තීය ගමන්මග

ගිණුම් තැබීම, දත්ත හැසිරවීම, නෛතික කරුණු සහ පාරිභෝගික සේවා වැනි සිය සහාය කාර්යයන් සිදුකිරීමට ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ ක්ෂේත්‍රය මහා පරිමාණ ආයතනයන්ට සහාය දක්වයි. මෙය ලොව පුරා සේවාදායකයින් සමග සුදුසුකම්ලත් වෘත්තිකයින් දහස් ගනනක් එකට එක්ව කටයුතු කරන්නාවූ විශාල ක්ෂේත්‍රයකි. එසේම ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය ශ්‍රී ලංකාවේද වඩාත් වේගයෙන් වර්ධනය වන රැකියා ක්ෂේත්‍රයකි.



**ජ්‍යෙෂ්ඨ තනතුරු - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී/ සහකාර උප සභාපති/ සාමාන්‍යාධිකාරී/ උප සභාපති/ දේශීය ප්‍රධානී (නේවාසික ප්‍රධානී)**

**පශ්චාත් උපාධි සුදුසුකම් - පළපුරුද්ද සමග ව්‍යාපාර කළමණාකරන (MBA) උපාධියක්**

**කළමනාකරණ තනතුරු - කණ්ඩායම් ප්‍රධානී, සහකාර කළමනාකරු, කළමනාකරු, ජ්‍යෙෂ්ඨ කළමනාකරු**

| AAT, CMA, CA, CIMA, B com - වාණිජවේදී උපාධිය, BSc in Accounting - ගිණුම් තැබීම පිළිබඳ විද්‍යාවේදී උපාධිය, ACCA,CFA | නීතිවේදී - LLB<br>පශ්චාත් නීති උපාධි - LLM | ඕනෑම උපාධියක් |
|---|---|---|
| පොත්තැබීම සහ ගිණුම්කරණය; වැටුප් සැකසීම සහ බදුකරණය; ගිණුම් නිමාකිරීම; ආයෝජන සමීක්ෂණ සහ විශ්ලේෂණය | නීතිමය කටයුතු සඳහා සහාය; නීති කෘත්‍යය පවත්වා ගෙන යාම; පූර්ව නීති කටයුතු | සහාය සේවා/ පාරිභෝගික පැමිණිලි විසඳීම්; දුරස්ථ අලෙවිකරණය (ටෙලි මාකටින්) |

**ආරම්භක මට්ටමේ තනතුරු/ සහකාර නිලධාරී, විධායක නිලධාරී, ජ්‍යෙෂ්ඨ විධායක**

| | | | |
|---|---|---|---|
| බැංකු සහ මූල්‍ය<br>ගිණුම්තැබීම පිළිබඳ දැනීම<br>ගිණුම් තැබීමේ මෘදුකාංග<br>MS Office | මූල්‍ය වාර්තාකරනය<br>සහ සමීක්ෂණ<br>සංඛ්‍යාතුරුව<br>MS Office<br>ඉදිරිපත් කිරීමේ නිපුනතා | නීති සේවා<br>කෙටුම්පත්කරණය<br>පර්යේෂණ | පාරිභෝගික සේවා<br>සන්නිවේදන නිපුනතා |

**අ.පො.ස. සා. පෙළ/ උ. පෙළ + මූලික නිපුනතා : මනා ඉංග්‍රීසි දැනීම + පරිගණක නිපුනතා**

ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ ක්ෂේත්‍රය වඩාත් විවිධත්වයෙන් යුතු ක්ෂේත්‍රයක් වන අතර විවිධ පසුබිම් වලින් යුතු වෙනත් ක්ෂේත්‍රයන් ගෙන් පැමිණෙන්නන්ට ඊට අවතීර්ණ වන්නට ඉඩ ප්‍රස්ථාව ඇත. ගණකාධිකාරීවරුන්, නීතිවේදීන්, පර්යේෂකයින්, වෛද්‍ය වෘත්තිකයින්, ගෘහනිර්මාණ ශිල්පීන්, අලෙවිකරුවන් සහ වෙනත් බොහෝ වෘත්තිකයින් විවිධ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ ආයතනවල සේවය කරති.

තෝරාගත් අංශයේ අධ්‍යාපන සුදුසුකම්, ඉංග්‍රීසි භාෂා හැකියාව සහ මූලික තොරතුරු තාක්ෂණ හැකියාව වැනි න්‍යායාත්මක නිපුනතා මෙම ක්ෂේත්‍රයට පිවිසීමට අවශ්‍ය මූලික සුදුසුකම්වේ. ඔබ කැපවීමෙන් කටයුතු කරන ප්‍රබෝධමත් සහ අභියෝගාත්මක ජාත්‍යන්තර තලයේ පරිසරයක වැඩකිරීමට අපේක්ෂාවෙන් සිටින්නෙක් නම් මේ ඔබට සරිලනම වෘත්තියයි.



FUTURE CAREERS
Step into the exciting world of IT-BPM

www.FutureCareers.lk